# පානදුර බාලිකා මහා විද්‍යාලය - කළුතර
## වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්
## 13 ශ්‍රේණිය

ලංකා ඉතිහාසය | 25-S-2

සැලකිය යුතුයි.
පළමුවන ප්‍රශ්නය (A කොටස) අනිවාර්ය වේ.
B හා C කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.
පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.

### A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| 01 පරංගි ආරු | 05 බටදොඹ ලෙන | 09 යාපනය |
| 02 කිරිඳි ඔය | 06 අලිමංකඩ | 10 ගම්පොළ |
| 03 ලංකා පටුන | 07 නාච්චදූව වැව | 11 උදුම්බරාගිර |
| 04 තොටළුතොට | 08 ගිරිතලේ වැව | 12 වාකිරිගල |

(ලකුණු 12)

### B කොටස

02. ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී පුරාවිද්‍යා මූලාශ්‍රය වලින් ලැබෙන සහය අනුපමේය වේ. ශිලාලේඛන හා චිත්‍ර, මූර්ති, කැටයම් යන පුරාවිද්‍යා මූලාශ්‍රයෝ ලංකා ඉතිහාසය ගොඩනැගීමෙහිලා දායක වී ඇති අයුරු පහදන්න. (ලකුණු 16)

03. අතීතයේ සිට ම ලංකාවේ ආර්ථිකය ගොඩනැංවීමට ලංකාවේ ගංගා පද්ධතිය හා මධ්‍යම කඳුකරය දායක වූ අයුරු පහදන්න. (ලකුණු 16)

04. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා පරිසරය ඇසුරෙන් රැස්කරගත් අත්දැකීම් ද ඇතිව විවිධ තාක්ෂණික නිර්මාණ සමගින් පූර්ව ඓතිහාසික යුගයට පිවිසියේ ය. පූර්ව ඓතිහාසික මානවයාගේ තාක්ෂණික හා විද්‍යාත්මක ජයග්‍රහණයන් පිළිබඳ විස්තරයක් කරන්න (ලකුණු 16)

05. දැනට ලැබී ඇති සාධක අනුව ක්‍රි. පූ. 6 වන සියවසෙන් පසු කාලයේ ලංකාවට විදෙස් සංක්‍රමණිකයින්ගේ පැමිණීම වැඩි වූ වගක් පෙනී යයි. මේ සියලු ම සංක්‍රමණිකයින් පැමිණියේ ඉන්දීය උප මහද්වීපය හරහා ය. මේ නිසා ලංකා ඉතිහාසයේ විවිධ අංශ කෙරෙහි භාරතීය බලපෑම ද වැඩි විය. පහදන්න. (ලකුණු 16)

### C කොටස

06. පණ්ඩුකාභය රජදවස ලංකාවේ ආගමික හා සංස්කෘතික වැදගත්කම පිළිබඳ පහදන්න. (ලකුණු 16)

07. අනුරාධපුර යුගයේ ලාංකිකයින්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම පිළිබඳ පහත මාතෘකා ද ඇසුරු කරගනිමින් පහදන්න.

| | |
|---|---|
| දැවැන්ත වාරි ව්‍යාපෘති දියත් කිරීම. | විවිධ විද්‍යාත්මක නිර්මාණ සිදුකිරීම. |
| දැවැන්ත ඉදිකිරීම් සඳහා යොමු වීම. | සාමුද්‍රික විද්‍යා ඥානය. |

(ලකුණු 16)

08. පහත මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ප්‍රමාණවත් ඓතිහාසික විස්තරයක් කරන්න.

| | |
|---|---|
| අනුරාධපුර නගරය ගොඩනැංවීම. | සේන ගුත්තික ආක්‍රමණය. |
| සීගිරිය. | මහා පරාක්‍රමබාහු රජුගේ බුරුම ආක්‍රමණය. |

(එක් කොටසකට ලකුණු 8 බැගින්)

09. මහා විජයබාහු රජතුමා අත්දැකීම් තුළින් උගනිමින් ද, අභියෝග හමුවේ නොසැලෙමින් ද, ලංකාව චෝළ ආක්‍රමණිකයින්ගෙන් ගලවාගත් අයුරු පහදන්න. (ලකුණු 16)

# පානදුර බාලිකා මහා විද්‍යාලය - කළුතර

## වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්

## 13 ශ්‍රේණිය

ලංකා ඉතිහාසය

25-S-2

